සීතාවක ප්‍රාදේශීය සභාව

පීඩාකාරී ව්‍යාපාර,අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන , කාර්ය කර්තව්‍ය ඉටුකරන සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ. ඒ. චන්දන පද්මසිරි වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට පීඩාකාරී ව්‍යාපාර ,අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර සම්බන්ධ නියමයන් පහත ආකාරයට වියයුතු බවට 2017/10/12 දින අංක 9265 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2017/10/12 දින,
සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී,

කේ.ඒ.චන්දන පද්මසිරි,
ලේකම්හා බලතල,කාර්ය,කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

තීරණය

2017ජනවාරි මස 01 දින සීතාවක ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගත් 1952 අංක 6 දරන පළාත්පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පළාත්පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් සම්පාදනය කළ අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ පළ කර අංක 1976/21 දරන 2016 ජූලි මස 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර පිළිගත්තා වූසම්මත අතුරු ව්‍යවස්ථාවලපීඩාකාරී ව්‍යාපාර,අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර අතුරු ව්‍යවස්ථාව යටතේ පහත පළමු , දෙවන හා තෙවන උපලේඛනයන්හි සඳහන් ව්‍යාපාරයන් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පීඩාකාරී ,අන්තරාදායක හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බවට මම තීරණය කරමි.

පළමුවනඋපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
2. සම් පදම් කිරීම.
3. සම් විකිණීම.
4. සත්ත්ව පාලනය (මස්,කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම.
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම.
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
8. කරවල,ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
11. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13. සබන් නිෂ්පාදනය කිරීම.
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
15. අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
18. වේවැල් භාණ්ඩ නිපදවීම.
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
20. සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම.
21. රසකැවිලි වර්ග නිපදවීම.

22. පොල් ලෙලි පෙහවීම හෝ පල් කිරිම
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)

24. දත් බුරුසු නිපදවීම

25. [illegible] රා පහනු කිරීම.

26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම.

27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම.

28. පින්තාරු තීන්ත,තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

29. සෝඩා නිපදවීම.

30. සම් භාණ්ඩ නිපදවීම.

31. පළතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම.

32. මිරිස්,කෝපි,ධාන්‍ය වර්ග,මාෂභෝග,කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම් හලක් පැවැත්වීම.

33. ඉටිපන්දම් නිපදවීම.

34. කපුරු නිපදවීම.

35. ලියන තීන්ත,අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

36. රෙදි සෝදන නිල් නිපදවීම.

37. ලාකඩ නිපදවීම.

38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.

39. පාසල් රටහුණු නිපදවීම.

40. ටයර් හෝ ටියුබ් 50 වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තබා ගැනීම.

41. ටයර් නැවත පිරවීම.

42. ටයර් ටියුබ් වොක්ලකනිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.

43. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.

47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.

48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම

49. ධාන්‍ය හෝ මාෂභෝග කිලෝ ග්‍රෑම් 250 ක ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

දෙවන උපලේඛනය
අන්තරාදායක ව්‍යාපාර

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි,ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
2. මැසු ඇඳුම් නිෂ්පාදනය කිරීම.
3. මුද්‍රණාලයක් පැවැත් වීම.
4. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
5. එළුවන්,ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත් වීම.
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.
7. දර ගබඩාවක් පැවැත්වීම.
8. කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්.
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

අයිස්ක්‍රීම් නිෂ්පාදනය.

. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

12. ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.

13. කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.

14. පාවිච්චි කල ඇඳුම් ගබඩා කිරීම.

15. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.

17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම.

18. හිස් ගෝණි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම.

19. පාපැදි හා යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම.

20. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම.

21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත් වීම.

22. ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම.

23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.

24. ශීත කල මස් හෝ මාළු ගබඩා කිරීම.

25. දැව ගබඩා කිරීම.

තෙවන උපලේඛනය

පීඩාකාරී අන්තරාදායක ව්‍යාපාර

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු , එනසාල් හෝ කෙදි කිරීම.
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම.
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම.
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත් වීම.
5. හුණු ගල් හෝ කිරි ගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළු හුණු ගබඩා කිරීම.
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත් වීම.
7. මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත් වීම.
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත් වීම.
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
10. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
11. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත් වීම.
12. ආයුර්වේද ඖෂධ , දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම.
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම.
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
15. කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් තේකුඩු ගබඩා කොට තබා ගැනීම.
16. වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම.
17. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත් වීම.
18. පැට්‍රෝල්,ඩීසල් ,තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම.
20. වායුසමන යන්ත්‍ර ,ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
21. විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
22. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත් වීම.
23. ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රියකරණය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

සිංහල , දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.